සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/SW/14/19/01/Circular
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2023.03.17

සියළුම දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ /දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂ,
සමෘද්ධි කළමණාකරුවන් / ප්‍රවර්ධන නිලධාරීන් /සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**ආර්ථික වශයෙන් ශක්තිමත් වූ ප්‍රතිලාභීන් සහිත සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම - 2022**

උක්ත ශීර්ෂය යටතේ මාගේ සමාංක හා 2022.03.10 දිනැති ලිපිය හා බැඳේ.

02. සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට වසම් මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත සමෘද්ධි වැඩසටහන් වල ප්‍රතිලාභ අනෙකුත් අඩු ආදායම්ලාභී පවුල් වෙත ද ලබාදීමට හැකිවන පරිදි මෙන්ම, මේ වන විට සමෘද්ධි වැඩසටහන තුල හඳුනාගෙන ඇති විෂමතාවයන් අවම කිරීමට ද හැකිවන පරිදි ක්‍රියා මාර්ග ගැනීමට එම ලිපිය මඟින් උපදෙස් ලබා දී ඇත.

03. ඒ අනුව ප්‍රධාන කාණ්ඩ 06 යටතේ, මේ වන විට ලබමින් සිටින සමෘද්ධි සහනාධාරය ඉවත් කිරීමට උපදෙස් ලබාදී ඇත. එහි පළමු කාණ්ඩය යටතේ බහුකාර්ය සංවර්ධන කාර්ය සාධන බලකා දෙපාර්තමේන්තුව මඟින් බහුකාර්ය සහායකයින් ලෙස තෝරාගෙන එකී කාර්ය වල නිරතව සිටින සාමාජිකයින් හා උපාධිධාරී සංවර්ධන නිලධාරීන් ඇතුලත් පවුල් සහනාධාර ලැයිස්තුවෙන් ඉවත් කිරීමට කටයුතු සිදු කළ යුතුව ඇත.

04. අග්‍රාමාත්‍ය ලේකම් විසින් PMO/SEC/01/09 හා 2023.02.28 දිනැතිව මා හට ද පිටපතක් සහිතව අප අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇති ලිපිය අනුව විශේෂයෙන් බහුකාර්ය සංවර්ධන සහායකයින් සිටින සමෘද්ධි සහනාධාර පවුල් සමෘද්ධි සහනාධාර ලැයිස්තුවෙන් නිසි පරිදි ඉවත් කර ඇති ද යන්න සමාලෝචනයට ලක් කළ යුතුව ඇත.

05. අනතුරුව මීට අදාල වාර්තා අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීම සිදු කළ යුතු වේ. ඒ අනුව ඉහත සඳහන්ව ඇති මා විසින් ඔබ වෙත යොමු කර ඇති ලිපියට අනුව ඔබ දිස්ත්‍රික්කයේ බහු කාර්ය සංවර්ධන සහායක පත්වීම්ලාභීන් සිටින සමෘද්ධි සහනාධාරය ඉවත් කරන ලද පවුල් ඒකක සංඛ්‍යාව මේ සමඟ ඇති ඇමුණුමේ ආකාරයට සකස් කර 2023.03.29 දිනට පෙර divirelief@gmail.com විද්‍යුත් ලිපිනයට මා වෙත එවන මෙන් කාරුණිකව දන්වමි.

ආර්.පී.කේ. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-
1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
4. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28877** |